# සෝත යනු ආර්ය අෂ්ටාංගික මාර්ගය වෙයි ආර්ය අෂ්ටාංගික මාර්ගයෙන් යුතු වීම සෝතාපන්න වීම වෙයි

## දුතිය සාරිපුත්ත සූත්‍රය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, සංයුත්ත නිකාය 5 - ii - පිටු අංක 146 - 147)

සෝතාපත්ති අංග කවරේ ද?

කල්‍යාණ මිත්‍ර සේවනය සෝතාපත්ති අංගයකි, සද්ධර්ම ශ්‍රවණය සෝතාපත්ති අංගයකි, යෝනිසෝමනසිකාරය සෝතාපත්ති අංගයකි, ධම්මානුධම්ම ප්‍රතිපදාව සෝතාපත්ති අංගයකි.

**කල්‍යාණ මිත්‍ර සේවනය යනු;**

ශාස්තෘන් වහන්සේ හෝ ශාස්තෘන් වහන්සේගේ ධර්මය ප්‍රකාශ කරන ශ්‍රාවකයකු ඇසුරු කිරීම කල්‍යාණ මිත්‍ර සේවනය වෙයි.

**සද්ධර්ම ශ්‍රවණය යනු;**

ඒ කල්‍යාණ මිත්‍රයාගෙන් සත්‍ය අනුලෝමික ඥානය සපිත වූ (යෙදුණු) චතුරාර්ය සත්‍ය හොඳින් දැනගැනීම සද්ධර්ම ශ්‍රවණය වෙයි.

**යෝනිසෝමනසිකාරය යනු;**

උදය වය ඥානයෙන් යුතු ව ස්කන්ධ, ධාතු හා ආයතනත අනිත්‍ය, දුක්ඛ හා අනාත්ම ලෙස නුවණින් විමසීම යෝනිසෝමනසිකාරය වෙයි.

**ධම්මානුධම්ම ප්‍රතිපදාව යනු;**

කතා කරන විට ධර්මය ම කතා කිරීම සහ අධර්මය කතා නොකිරීමට හික්මීම, සිතන විට ධර්මය ම සිතීම සහ අධර්මය ගැන නොසිතීමට හික්මීම, අන් සෑම අවස්ථාවක ම සිහි නුවණින් (සති සම්පජඤ්ඤයෙන්) යුතු ව මැදහත් ව ජීවත් වීමට හික්මීම ධම්මානුධම්ම ප්‍රතිපදාව වෙයි.

### සෝතය යනු කවරේ ද?

සෝතය යනු ආර්ය අෂ්ටාංගික මාර්ගය වෙයි. එනම් සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති සහ සම්මා සමාධි වෙයි.

### සෝතාපන්න යනු කවරේ ද?

යමෙක් මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයෙන් යුතු වූයේ සෝතාපන්න යැයි කියනු ලැබෙයි.